**ජනාධිපතිවරණයේදී අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමට සුදුසුකම්:-**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
2. වයස අවුරුදු 30ට වැඩිවීම.
3. ඡන්ද බලය හිමි තැනැත්තෙකු වීම එනම් ඡන්ද හිමියෙකු වීමට සුදුසුකම් ලබා ඇති තැනැත්තෙකු වීම.
4. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 ව්‍යවස්ථාවේ නුසුදුසුකමකට යටත් නොවීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)
5. පිළිගත් දේශපාලන පක්ෂයකින් නම් සුදුසුකම් ලබා ඇති කවර හෝ පුරවැසියෙකු වීම, වෙනත් දේශපාලන පක්ෂයක් හෝ ඡන්ද හිමියකු විසින් නාමයෝජනා කරන තැනැත්තෙකු නම්, පාර්ලිමේන්තුවේ සිටින හෝ සිටි මන්ත්‍රීවරයකු වීම.
6. ජනාධිපති ධූරය සඳහා ජනතාව විසින් දෙවරක් තෝරා පත්කරගත් අයෙකු නොවීම.

**ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු ලෙස තරඟ කිරීමට නුසුදුසුකම්:-**

1. ඉහත සුදුසුකම් නොමැති වීම.
2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 ව්‍යවස්ථාවේ නුසුදුසුකමකට යටත්වීම (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)
3. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 ව්‍යවස්ථාව ප්‍රකාර නුසුදුසුකමකට ලක්වීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේදී නාමයෝජනා භාරදෙන අවස්ථාවේදී එවකට මැතිවරණ කොමසාරිස්වරයා (දැන් මැතිවරණ කොමිෂන් සභාව) විසින් නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු අවස්ථා 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ 15 වන වගන්තිය යටතේ දක්වා ඇත (1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත)